23.03.2026

නිශ්පාදක,

රතු ඉර වැඩසටහන,

ස්වර්ණවාහිනී

අංක 752/5,

ඩොක්ටර් ඩැනිස්ටර් ද සිල්වා මාවත,

කොළඹ 09,

මහත්මයාණනි,

**2026 මාර්තු 19 දින විකාශනය වූ රතු ඉර වැඩසටහන සම්බන්දවයි.**

ඉහත වැඩසටහනට සහභාගි වූ, ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මහතා විසින් මා සම්බන්දයෙන් සිදු කරන ලද සාවද්‍ය ප්‍රකාශයක් සම්බන්දයෙන් ඔබගේ  අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

එහිදී නිවේදක මහතා විසින් බාල ගල් අඟුරු ආනයනය කල සිදුවීම සම්බන්ධයෙන් ඔහුගෙන් විමසන ලද ප්‍රශ්ණයකට පිළිතුරු වශයෙන් ටිල්වින් සිල්වා මහතා පැවසුවේ පාඨලී චම්පික රණවක බලශක්ති ඇමති වරයා වශයෙන්  සිටි කාලයේදීත් බාල ගල් අඟුරු ගෙන්වා ඇති බවත්, ඒවායෙන් බලාගාරයටත් විදුලි නිශ්පාදනයටත් කිසිදු හානියක් නොවන බව එක්තරා අවස්ථාවක පැවසූ බවත් ය.

මෙය ඉතාම සාවද්‍ය ප්‍රකාශයක් වන අතර, චේතාන්විතව මාගේ කීර්ති නාමයටත් ගෞරවයටත් හානිවන ආකාරයෙන් සිදුකල ප්‍රකාශයකි.

මේ පිළිබඳව නිවැරදි තොරතුරු මහජනයා හමුවේ ඉදිරිපත් කර, ඇති කර ඇති ව්‍යාකූල තත්වය සමනය කිරීමට අවස්තාව ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

මාගේ පෞද්ගලික කීර්ති නාමයට හානි සිදුවීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමේ ක්‍රියාමාර්ග වලට අවතීරණ වීමට පෙර කරුණු නිවැරදි කිරීමේ අවස්තාවක් ලබා දෙන මෙන් ඔබ අයතනයෙන් ඉල්ලා සිටිමි.

මෙයට,

.......................................

පාඨලී චම්පික රණවක

නායක - එක්සත් ජනරජ පෙරමුණ